# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

# பொலிஸ் ஊடகப் பிரிவு

# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2026.03.05<br>පැය 1430 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/392/2026 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |


**සංවිධානාත්මක අපරාධකරුවෙකු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් මිලදීගෙන ඇතැයි සැලකෙන රුපියල් කෝටි 03 ක් පමණ වටිනාකමින් යුත් දේපල ක්‍රියා විරහිත කිරීම - නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය.**

විදෙස්ගතව සිටියදී පසුගිය දා මෙරටට රැගෙන එන ලද සංවිධානාත්මක අපරාධකරුවෙකු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් ඔහුගේ දියණියගේ නමින් මිලදී ගෙන ඇති බවට සැලකෙන දේපලක් සම්බන්ධයෙන් නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය වෙත ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

ඒ අනුව සිදුකරන ලද විමර්ශනයේදී මෙම සංවිධානාත්මක අපරාධකරු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් මිලදී ගෙන ඇතැයි සැලකෙන පන්නිපිටිය ප්‍රදේශයේ පිහිටි දෙමහල් නිවසක් සහිත රුපියල් කෝටි 03 ක් පමණ වටිනා ඉඩමක් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ප්‍රකාරව 2026.03.05 දින සිට දින 07ක කාලයක් සඳහා ක්‍රියා විරහිත කිරීමේ නියෝග නිකුත් කර ඇත.

නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

**Property worth Rs. 30 Million Allegedly Purchased Using Proceeds from Drug Trafficking – Illicit Assets Investigation Division**

The Illicit Assets Investigation Division has commenced an investigation following a complaint regarding an organized criminal who was recently brought back to Sri Lanka from overseas. The complaint relates to a property suspected to have been purchased in the name of his daughter using proceeds generated from drug trafficking.

Accordingly, during the course of the investigation, a two-storey house and the land on which it stands, located in the Pannipitiya area and valued at approximately Rs. 30 million, is believed to have been acquired by the suspect using funds derived from narcotics trafficking.

Under the provisions of the Prevention of Money Laundering Act, the property has been ordered to be frozen for a period of seven days with effect from 05.03.2026.

Further investigations are being carried out by the Illicit Assets Investigation Division.

**Police Media Division**